සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 11 - ශ්‍රේණිය

## පෙරදිග සංගීතය - I

නම/විභාග අංකය :- ........................................................ කාලය: පැය 01 යි.

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) රාග ජාතියට අනුව සම්පූර්ණ වර්ගයට අයත් නොවන රාගය කුමක් ද?
(1) යමන් (2) කාෆි (3) භූපාලි (4) භෛරවී

(02) රාත්‍රී ප්‍රථම ප්‍රහරයේ ගැයෙන රාග යුගලයට පොදු ලක්ෂණයකි.
(1) ගාන්ධාරය වාදී වේ. (2) ධෛවතය සංවාදී වේ.
(3) සම්පූර්ණ ජාතී වේ. (4) ශුද්ධ ස්වර පමණක් යෙදේ.

(03) ෂඩ්ජය සංවාදී ස්වරය වන රාග යුගලයකි.
(1) කාෆි, බිලාවල් (2) භෛරවී, කාෆි (3) භෛරවී, යමන් (4) බිලාවල්, භෛරවී

(04) රාගයක් බිහිවන්නේ මේලයකින් බවත් උතුරු ඉන්දියානු හින්දුස්ථානී සංගීතයේ මේල දහයක් භාවිතා වන බවත් පෙන්වා දුන්නේ,
(1) අමීර් කුෂ්රු (2) රවි ශංකර් (3) ශකීර් හුසේන් (4) භාත්ඛණ්ඩේ

(05) රාගයක කිසිවිට අත් නොහරින ස්වරයක් වනුයේ,
(1) සඩ්ජය (2) රිෂභය (3) මධ්‍යමය (4) පංචමය

(06) සාදු දන්තදා ගීතයේ නාද මාලාව ඇසුරු කර ඇති රාගය කුමක් ද?
(1) බිලාවල් (2) භූපාලි (3) යමන් (4) කාෆි

(07) ස රි ම ප නි අනුවාදී ස්වර ලෙස යෙදෙන රාගය වනුයේ,
(1) බිලාවල් (2) යමන් (3) කාෆි (4) භූපාලි

(08) භෛරවී රාගයේ මුඛ්‍යාංගය තෝරන්න.
(1) ම ගු ස රි ස ධු නි ස (2) ම ගු ස ධු නි ප ධු ස (3) ස රි ගු ම ගු රි ස (4) ධු ම ධු නි සං රිං සං

(09) සරි ගුගු රිගු පප | ගුප ධුධු පධු සංසං මෙය කුමන වර්ගයට අයත් තානාලංකාරයක් ද?
(1) සරල තාන් (2) අලංකාරික තාන් (3) බෝල් තාන් (4) මිශ්‍ර තාන්

(10) නිර්දේශිත රාග අතුරින් විකෘති ස්වර එකක් හා දෙකක් වශයෙන් යෙදෙන රාග යුගලය පිළිවෙළින්
(1) කාෆි හා භෛරවී වේ. (2) කාෆි හා යමන් වේ. (3) යමන් හා කාෆි වේ. (4) යමන් හා භෛරවී වේ.

- **අංක 11 සිට 14 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් ගී පාදය උපයෝගී කර ගන්න.**

  පිපෙන | මල්මත | බඹරු | වහලා S

(11) මෙම ගී පාදය ගැයීමට සුදුසු හින්දුස්ථානී තාලය කුමක් ද?
(1) ත්‍රිතාලය (2) දාදරා තාලය (3) ජප් තාලය (4) දීප්චන්දි තාලය

(12) දෙවන හා සිව්වන විභාගවල එක් මාත්‍රාව බැගින් අඩු කළ විට ලැබෙන තාලය නම් කරන්න.
(1) කෙහෙර්වා තාලය (2) ජප් තාලය (3) ත්‍රිතාලය (4) දාදරා තාලය

(13) පිපෙනා මල්මත බඹරුන් වහලා යනුවෙන් පදමාලාව වෙනස් වූ විට උචිත තාලය කුමක් ද?
(1) කෙහෙර්වා තාලය (2) ජප් තාලය (3) දීප්චන්දි තාලය (4) දාදරා තාලය

(14) මුලින් දක්වා ඇති ගී පාදයේ ඇති සියළුම විභාග කොටස්වලින් මාත්‍රාව බැගින් ඉවත් කළ විට ලැබෙන තාලය නම් කරන්න.
(1) දාදරා තාලය (2) ජප් තාලය (3) කෙහෙර්වා තාලය (4) දීප්චන්දි තාලය

- **පහත දක්වා ඇත්තේ ඔබගේ විෂය නිර්දේශයට අයත් ගායනා කිහිපයකට අදාළ තොරතුරු වේ. ඒ ඇසුරින් අංක 15 සිට 20 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
  - කවිකාර මඩුවේ දී ගායනා කර ඇත.
  - කර්ණාට සංගීතය භාවිතා කර ඇත.
  - සේ ගී වලට අයත් වේ.
  - ගැටබෙරය තාල වාදනය සඳහා යොදාගෙන ඇත.

(15) ඉහත තොරතුරු සියල්ල ම පොදුවේ දැකිය හැකි ගායනා විශේෂ තුනකි.
(1) වන්නම් හටන් ප්‍රශස්ති (2) ප්‍රශස්ති නාඩගම් හටන්
(3) හටන් සිංදුවන්නම් ප්‍රශස්ති (4) ප්‍රශස්ති සිංදුවන්නම්, නාඩගම්

(16) නොමදින් විකුම් පාලා.... මෙම ගී ඇතුළත් ගී විශේෂය වනුයේ,
(1) වන්නම් (2) ප්‍රශස්ති (3) හටන් (4) තූර්ති

(17) මෙම ගායනාවල තනු නිර්මාණයට දායක වූ සංගීතඥයෙකි.
(1) අලගනායිදු (2) විශ්වනාත් ලව්ජි (3) අමීර් කුශ්රු (4) ගණිතාලංකාර

(18) මුද්‍රප්පදය නම් සංගීතාංගය ඇතුළත් ගී විශේෂය නම් කරන්න.
(1) ප්‍රශස්ති (2) වන්නම් (3) හටන් (4) නාඩගම්

(19) කස්තිරම, සීරුමාරුව, අඩව්ව යන පද භාවිතා වන්නේ මෙම යුගයේ රචිත කිනම් ගායනා ඇසුරින් ද?
(1) ප්‍රශස්ති (2) වන්නම් (3) නාඩගම් (4) හටන්

(20) ප්‍රශස්ති ගායනා ඇසුරෙන් නිර්මාණය කරන ප්‍රකට ගීතයක් වනුයේ,
(1) සිරි ලංකා රජින්දා වේ (2) රුක් අත්තන මල මුදුනේ
(3) තෙදිනි විරාජ (4) වගුරට නරනිඳු

(21) කොබෝ S | කුරුලු | වනේ S | S S S | මෙම කවි පාදයේ සඳැස්මත් හා ගී මත් ගණන ලියන්න.
(1) 9, 12 කි (2) 10, 12 කි (3) 7, 9 කි (4) 7, 12 කි

(22) විෂම ග්‍රහයෙන් ගැයෙන ගීතයකට උදාහරණයකි,
(1) ලංකා ලංකා පෙම්බර ලංකා (2) සසර වසන තුරු
(3) රත්න දීප ජන්ම භූමි (4) හෙළ ජාතික අභිමානේ

(23) පොතේගුරු හා සබේ විදානේ චරිත දෙක දැකිය හැකි රංග සම්ප්‍රදායන් දෙක පිළිවෙළින් ලියන්න.
(1) නූර්ති නාඩගම්　(2) නාඩගම්, කෝළම්　(3) කෝළම්, නාඩගම්　(4) නූර්ති, කෝළම්

(24) තාලයෙන් තොරව ගැයෙන සංගීතාංගය හා එය ඇතුළත් නාට්‍ය සම්ප්‍රදාය නම් කරන්න.
(1) උරුට්ටුව, නාඩගම්　(2) දොහොරාව, නාඩගම්　(3) දොහොරාව, නූර්ති　(4) උරුට්ටුව, නූර්ති

(25) දෙබස්වලින් තොර මිහිරි සංගීතය මගින් හැඟීම් ප්‍රකාශය කරනු ලබන නව නාට්‍ය සම්ප්‍රදාය කුමක් ද?
(1) ශෛලිගත නාට්‍ය　(2) ගීත නාට්‍ය　(3) ස්වභාවික නාට්‍ය　(3) මුද්‍රා නාට්‍ය

(26) "මැ වේ මා දුටු කොමළ ලියා" ගීතය ඇතුළත් නව නාට්‍ය නම් කරන්න.
(1) නරිබෑණා　(2) මනමේ　(3) සිංහබාහු　(4) කුවේණි

- **පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ ජන සංගීත ක්ෂේත්‍රයේ විශාල මෙහෙවරක් කරන ලද සංගීත ශිල්පීන්ගේ රූප සටහන් කිහිපයකි. ඒ ඇසුරින් අංක 27 සිට 30 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A　B　C　D



(27) දෙපොනෝ ගීත නාට්‍යයේ නිර්මාතෘ වූ මෙතුමා හෙළ ගී මග ග්‍රන්ථය ලිවීමෙන් ජන සංගීතයට විශාල මෙහෙවරක් සිදු කළේ ය.
(1) A　(2) B　(3) C　(4) D

(28) ජන සංගීතය පිළිබඳ ප්‍රකට කෘතීන් වන ශ්‍රී ලංකාවේ සංගීත සම්භවය, ජන සංගීත සිද්ධාන්ත ලියන ලද්දේ මෙතුමා විසින් ය.
(1) A　(2) B　(3) C　(4) D

(29) ළමා නාට්‍ය නිෂ්පාදකයෙකු මෙන් ම දක්ෂ නිරූපණ ශිල්පියෙකු ලෙස දෙපානෝ නාට්‍යයේ රංගනයෙන් දායක වුණු මෙතුමාගේ ජනප්‍රිය ගී නිර්මාණයකි.
(1) දැතට වලලු　(2) ඇහැළ මලින් ගස් පිරිලා
(3) මේ අවුරුදු කාලේ　(4) කුමට ද සොබනියෙ

(30) ගජමන් පුවත, ආනන්ද ජවනිකා, ජස ලෙංචිනා වැනි නාට්‍ය සඳහා සංගීතය සැපයූ මොහු නර්තන ගුරුවරයෙකු බෙර වාදන ශිල්පියෙකු ගායකයෙකු හා රංගන ශිල්පියෙකු ලෙස විශාල මෙහෙවරක් සිදු කරන ලද සංගීතඥයෙකි.
(1) A　(2) B　(3) C　(4) D

(31) ප නි රි̇ ස්වර තුන එකවර වැයීමේ දී ලැබෙන කෝඩ් ටික හඳුන්වන්නේ,
(1) G මේජර්　(2) D මේජර්　(3) G මයිනර්　(4) D මයිනර්

(32) කපිරිඤ්ඤා ගී ඇසුරු කර ගනිමින් නිර්මාණය කරන ලද ගීතයකි.
(1) රස ආහර කවලා　(2) මුහුදු පතුල යට ඉඳලා
(3) ආලෙ බැන්ද මාගෙ　(4) අඹ දඹ නාරං කෙසෙල් දෙල්

(33) විතතාතත වර්ගයට අයත් අවනද්ධ භාණ්ඩයකි
(1) ගැටබෙරය　(2) යක් බෙරය　(3) දවුල　(4) තම්මැට්ටම

(34) නැළවිලි ගී ඇසුරෙන් නිර්මාණය කරන ලද මිහිරි මව්ගුණ ගීතයකි.

(1) ගමට කලින් හිරු (2) ආදරයේ උල්පත වූ අම්මා
(3) සොම්නස හෝ සන්තාපය (4) මිහි මඬලේ අඳුරු කුසේ

(35) බවුජි බවුරා චිත්‍රපටයේ ඇතුළත් "තූ ගංගාකි මෞජ මේ" ගීතයේ තනු නිර්මාණය සඳහා ඇසුරු කර ගත් රාගය කුමක් ද?

(1) කාෆි (2) බිලාවල් (3) යමන් (4) භෛරවී

(36) ග්‍රැමෆෝනය සඳහා මුලින් ම තැටිගත කළ ගී විශේෂය නම් කරන්න.

(1) සරල ගී (2) නාඩගම් ගී (4) හින්දි ගී (4) නූර්ති ගී

(37) රතඳර සිරි පරදන නිමල කොමළ.... ගීතය ඇතුළත් නව නාට්‍යය කුමක් ද?

(1) කාලගෝල (2) මනමේ (3) කුස පබාවතී (4) රතු හැට්ටකාරී

(38) හරි ප්‍රසාද් චෞරසියා ශිල්පීය දක්ෂතා දැක්වූයේ කිනම් වාදන භාණ්ඩයක් සඳහා ද

(1) සිතාර් වාදනයට (2) බටනලා වාදනයට (3) තබ්ලා වාදනයට (4) එස්රාජ් වාදනයට

(39) පරිගණකය හා සම්බන්ධව යතුරු පුවරු සංගීත භාණ්ඩ මගින් කරනු ලබන නිර්මාණයක් හඳුන්වනුයේ කිනම් ලෙස ද?

(1) E learning (2) E Mu sic (3) Sound fonts (4) MIDI

(40) සංගීත ප්‍රසංගයක දී කටහඬ විවිධාකාරයෙන් වෙනස් කිරීමේ හැකියාව ඇති උපකරණය කුමක් ද?

(1) මයික්‍රෆෝනය (2) ඇම්ප්ලිෆයරය (3) මික්සරය (4) ස්පීකරය

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 11 - ශ්‍රේණිය

## පෙරදිග සංගීතය - II

**නම/විභාග අංකය :- ......................................................... කාලය: පැය 02 යි.**

පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) අංක (i) සිට (iv) තෙක් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමගින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(i) පංචමය වාදී ස්වරය ලෙස යෙදෙන රාගයේ නම ලියන්න.

(ii) අනුවාදී ස්වර තුනක් යෙදෙන රාගය කුමක් ද?

(iii) ශුද්ධ ස්වර පමණක් යෙදෙන රාගයක සර්ගම් ගීතයේ මුල් පාදය ප්‍රස්තාර කරන්න.

(iv) "මඳ සුළඟ සීතලයි" මෙම ගී පාදය ගැයීමට උචිත හින්දුස්ථානී තාලය නම් කරන්න.

- **අංක (v) සිට (viii) තෙක් ප්‍රශ්නවල දී ඇති හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය සමඟ ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.**

(v) හින්දුස්ථානී සංගීතයට අයත් ස්වර පිහිටීම අතින් සමාන තත් වාද්‍ය භාණ්ඩ යුගලය ...................................... යි.

(vi) නාඩගම් ගී තුළ යෙදෙන විශේෂ ගීතාංගය ...................................... නම් වේ.

(vii) F major ස්කේලයට අයත් ස්වර ...................................... වේ.

(viii) ගිටාරයේ සිව්වන තත ...................................... ස්වරය මත සුසර කෙරේ.

- **ප්‍රශ්න අංක (ix) සහ (x) හි හිස්තැන් සඳහා සුදුසු ම පිළිතුර වරහන් තුළින් තෝරා, ප්‍රශ්න අංක සමඟ ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.**

(කෙහෙර්වා, බිලාවල්, දාදරා, කාෆි)

(ix) "කඳුළු හෙලා නෑඹිලියට" සරල ගීතයේ පද ...................................... තාලය මත රචනා වී ඇති අතර, එන්ඩද මැණිකේ මමත් දියඹටා ගීතයේ පද ...................................... තාලය මත රචනා වී ඇත.

(x) "රකිණු ඊශ්වරා" යන නූර්ති ගීතයේ තනුව ...................................... රාගයේ ස්වර ඇසුරින් නිර්මාණය වී ඇති අතර, ලලිත කලා ඔප කරනා ගීතයේ නාදමාලාව ...................................... රාගයේ ස්වර ඇසුරුකර ඇත.

(02) පහත දැක්වෙන ප්‍රකාශ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(a) "අප ගුණසරු සිංහල භූපති" නූර්ති ගීතය හින්දුස්ථානී රාගධාරී සංගීතයේ ඇසුර ලබා ඇත.

(b) පෙ.ව. 6 - 9 අතර ගායන සමය යෙදී ඇති රාග දෙකකි.

(i) (b) යටතේ නම්කළ හැකි රාග දෙක ලියන්න.

(ii) (a) තොරතුරුවලට අදාළවන රාගය නම් කර, ඔබ නම් කළ රාගයේ ලක්ෂණ ගීතයේ ස්ථායී කොටසේ ගීත ස්වර ප්‍රස්තාරය ලියන්න.

(iii) ලක්ෂණ ගීතයක හා සර්ගම් ගීතයක අතර ඇති සමානතා හා අසමානතා දෙක බැගින් ලියන්න.

(03) පහත සඳහන් ස්වර ඛණ්ඩ නිර්දේශිත රාග ඇසුරෙන් සපයා ඇත.

A - ප රි ග රි නි රි ස ...

B - ධ නි ස් රි ස් නි ධ ....

C - රි ප ම ප ම ගු රි...

(i) ඉහත A, B, C රාග පිළිවෙලින් නම් කරන්න.

(ii) B හෝ C රාග දෙකෙන් එක් රාගයකට අයත් මධ්‍යලය ගීතයක, ලක්ෂණ ගීතයක හෝ වාදිතයක ස්ථායී අන්තරා ස්වර ප්‍රස්තාරය ලියන්න.

(iii) A රාගයේ මේලය, ආරෝහණ, වාදී, සංවාදී, මුඛ්‍යාංගය හා ගායන සමය ලියන්න.

(04) පහත දැක්වෙනුයේ ඔබ විෂය නිර්දේශයට අයත් වන්නමක හා කෙළි ගීයක ගැයෙන තානමේ මුල් පාද දෙකකි.

a. තාSන තනාS |තනත නෙනාS |තෙතන තනාS |තනත නෙනාS

b. තාSන තනාS තම්දෙ SSS |නාSත මිදෙනා නාSS SSS

(i) a හා b යටතේ දැක්වෙන තානම සමඟ ගැයෙන කවි පාදය බැගින් ලියන්න.

(ii) ඔබ ලියූ කවි පාද දෙක ගැමි ගී හා සේ ගී යටතේ බෙදා දක්වන්න.

(iii) ගැමි ගී හා සේ ගී කෙටියෙන් හඳුන්වා, ආඝාතාත්මක හා අනාඝාතාත්මක ගීයක් බැගින් උදාහරණ සපයන්න.

(iv) දොළොස්මස් සේ ගීයක් පද ප්‍රස්තාර කරන්න.

(05) 

(i) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට අනුව ස්වර ප්‍රස්තාර කරන්න. එම ප්‍රස්තාරය අයත් ගී වර්ගය ද නම් කරන්න.

(ii) ගීතයට උචිත Time sign ature (ටයිම් සිග්නේචර්) නම් කර, ඒ අනුව මාත්‍රා බෙදි ඇති දේශීය තාල පදය ප්‍රස්තාර කරන්න.

(iii) Minim, Semi breave, Rest mark, Tie note, Dotted note, Ledger line යන සංකේත කෙටියෙන් විස්තර කරන්න.

(06) පහත දී ඇති වාදන භාණ්ඩ වර්ගීකරණයන්ට ගැළපෙන එක් භාණ්ඩයක් බැගින් ලියන්න.

(i) a) තත් වාද්‍ය භාණ්ඩය

b) සුෂිර වාද්‍ය භාණ්ඩය

c) ඉපියාව සහිත භාණ්ඩය

d) ස්වර පුවරු භාණ්ඩය

e) සමාඝාත භාණ්ඩය

f) විතත භාණ්ඩය

(ii) යම් භාණ්ඩ දෙකක් වාදනයේ දී එම එම භාණ්ඩයන්හි නාදයන් වෙන් වෙන්ව හඳුනාගත හැකි වේ. මෙම ගුණය ඔබ නම් කරන්නේ කෙසේ ද? එසේ වීමට හේතු දෙකක් ලියන්න.

(iii) ඔබ පන්තිකාමරයේ දී වාදනය කරන ඕනෑම තත් වාද්‍ය භාණ්ඩයක දළ රූප සටහනක් ඇඳ එහි කොටස් 04ක් නම් කරන්න.

(07) පහත සඳහන් මාතෘකා අතරින් තුනක් තෝරාගෙන කෙටි විස්තරයක් කරුණු හතරකින් පමණ ලියන්න. උදාහරණ ද සපයන්න.

(i) සබරගමු වන්නම්

(ii) ග්‍රැමෆෝනයේ අනුකරණාත්මක ගීත යුගය

(iii) නව නාට්‍ය සම්ප්‍රදාය

(iv) ජන ගී ආශ්‍රිත සරල ගී

(v) සඳැස්මත් හා ගීමත්

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 11 - ශ්‍රේණිය

## පෙරදිග සංගීතය - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | 3 | (11) | 4 | (21) | 1 | (31) | 1 |
| (02) | 1 | (12) | 4 | (22) | 4 | (32) | 1 |
| (03) | 2 | (13) | 1 | (23) | 2 | (33) | 3 |
| (04) | 4 | (14) | 2 | (24) | 3 | (34) | 2 |
| (05) | 1 | (15) | 1 | (25) | 4 | (35) | 4 |
| (06) | 3 | (16) | 3 | (26) | 2 | (36) | 4 |
| (07) | 1 | (17) | 4 | (27) | 4 | (37) | 3 |
| (08) | 1 | (18) | 1 | (28) | 1 | (38) | 2 |
| (09) | 2 | (19) | 2 | (29) | 3 | (39) | 2 |
| (10) | 3 | (20) | 3 | (30) | 3 | (40) | 3 |

(ලකුණු 01 x 40 = 40)

### II පත්‍රය

**(01)** (i) කාෆි රාගය — (ii) භූපාලි රාගය

(iii) බිලාවල් හෝ භූපාලි සර්ගම් ගීතයේ මුල් පාදය — (iv) ජප් තාලය

(v) සිතාරය හා එස්රාජය — (vi) උරුට්ටුව

(vii) ම ප ධ <u>නි</u> ස̇ රි̇ ග̇ ම̇ හෝ

F G A B♭ C D E F

(viii) D ස්වරය (රි ස්වරය)

(ix) දාදරා, කෙහෙර්වා — (x) කාෆි, බිලාවල් (ලකුණු 12)

(02) (i) බිලාවල්, භෛරවී (ලකුණු 02)

(ii) භෛරවී රාගය (ලකුණු 01)

රාගයට අදාල ලක්ෂණ ගීතයේ නිවැරදි බව (ස්වර සංකේත යෙදීම අනිවාර්ය වේ.) (ලකුණු 05)

(iii) නිවැරදි කරුණු සඳහා (ලකුණු 04)

(03) (i) A යමන් රාගය

B බිලාවල් රාගය

C කාෆි රාගය (ලකුණු 03)

(ii) රාගය නම් කිරීම (ලකුණු 01)

නිවැරදි ස්වර ප්‍රස්තාරය (ලකුණු 05)

(iii) මේලය - කල්‍යාණ/ යමන්

ආරෝහණ - ස රි ග ම́ ප ධ නි ස̇

වාදි - ග
සංවාදී - නි
මුඛ්‍යාංගය - නි̣ රි ග රි ස, ප ම´ ග රි ස
ගායන සමය - රාත්‍රී පළමු ප්‍රහරය (රාත්‍රී 6 - 9) (ලකුණු 03)

(04) (i) a. කොහොවි යනා හඬ නගනා
b. අහසට පිඹිනා - එරං කලේයා.... ආදී කළගෙඩි කවි පාදයක් (ලකුණු 02)

(ii) a. සේ ගී
b. ගැමි ගී (ලකුණු 02)

(iii) නිවැරදි හැඳින්වීමට හා උදාහරණ නිවැරදිව ලිවීම (ලකුණු 04)

(iv) නිවැරදි ප්‍රස්තාරයට (රැගත් සුරා, සඳවාසුදු ආදී කවි) (ලකුණු 04)

(05) (i) දරු නැලවිලි ගී (ලකුණු 01)
ස ම ම ම | ම - - - | ම ධ ප ම | ග - මුගු රි (ලකුණු 04)

(ii) $\frac{4}{4}$ (ලකුණු 02)
මහ තනි තිත නම් කර නිවැරදිව ප්‍රස්තාර කිරීම සංකේත සහිතව (ලකුණු 02)

(iii) නිවැරදිව කෙටි සටහන් ලිවීම (ලකුණු 03)

(06) (i) උදාහරණ නිවැරදිව ලිවීම. (ලකුණු 03)
(ii) ධ්වනි ගුණය (ලකුණු 01)
නිර්මාණය වූ ද්‍රව්‍යය
නාදය උත්පාදනය වන ආකාරය
නිර්මිත ව්‍යුහයේ ප්‍රමාණය, හැඩය ආදී කරුණු දෙකක් ලිවීම. (ලකුණු 02)

(iii) දළ රූප සටහන (ලකුණු 02)
කොටස් 4 නම් කිරීම (ලකුණු 04)

(07) එක් කරුණකට ලකුණු 04 බැගින් මාතෘකා 03 වෙනුවෙන් ලකුණු 12 යි. උදාහරණ සපයා නොමැතිනම් ලකුණක් අඩුකළ යුතු වේ. (මුළු ලකුණු 12)

අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර පත්‍ර සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

www.lol.lk
Learn Ordinary Level

LOL.lk online Book Store

අමතන්න - 071 777 4440/0756999990/071 8540371




Online shopping
www.lol.lk
Learn Ordinary Level
DELIVERY ISLANDWIDE
SECURE PAYMENT

# LOL.lk
online Book Store

071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්













## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්













## කෙටි සටහන් පොත්













**වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට**

# www.lol.lk

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

# ප්‍රශ්නපත්‍ර පොත්
# ගෙදරටම ගෙන්ව ගන්න
# ඔන්ලයින් ඔඩර් කරන්න
# WWW.LOL.LK
# වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal VISA MasterCard DISCOVER
NO PAYPAL ACCOUNT NEEDED!

# ONLINE BOOK STORE



An evening of fun for young readers